PRESS RELEASE

**Case IH හා එලායන්ස් ෆිනෑන්ස් සමාගම හවුල්කාරීත්වයක් ඇති කරගනිමින් මෙරට කෘෂිකාර්මාන්තය නඟා සිටුවීමට ගොවීන්ට අතහිත දීමට සැරසෙයි.**

- Case IH ට්‍රැක්ටර් මෙරට වෙළඳපොළට හඳුන්වා දෙමින් එහි නවතම නිල බෙදාහරින්නා ලෙස එලායන්ස් ෆිනෑන්ස් සමාගම පත් කර ඇත.
- හඳුන්වාදෙන Case IH හි JXT බහු විධ ට්‍රැක්ටරය සහ Farmall JXM ට්‍රැක්ටර් පෙළ මගින් මෙරට ගොවීන්ගේ කෘෂිකාර්මික කටයුතු යන්ත්‍රානුසාරයෙන් පහසු කරවීමට අත්වැළක් සපයයි.
- ලොව සුපතල Case IH වෙළඳ නාමය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දිගු කලක්, විශ්වසනීයත්වය සහ කීර්ති නාමය දිනාගත්තකි.

**කොළඹ, ශ්‍රී ලංකා. 2018 සැප්තැම්බර් 21**

CNH ඉන්ඩස්ට්‍රියල් සමාගමේ වෙළඳ නාමයක් වන Case IH ට්‍රැක්ටරය මෙරට නිල බෙදාහරින්නා ලෙස, එලායන්ස් ෆිනෑන්ස් සමාගම නම් කරන ලදි. 1956 වර්ෂයේ ආරම්භ කළ එලායන්ස් ෆිනෑන්ස් සමාගම මෙරට කීර්තිමත් නාමයක් දිනාගෙන ඇති මූල්‍ය සමාගම් අතර ඉහළින්ම සිටියි. 1200 කට අධික සේවක සංඛ්‍යාවකගෙන්ද, දිවයින පුරා පිහිටි ශාඛා 93 කින් ද සමන්විත එලායන්ස් ෆිනෑන්ස් සමාගම, නිරතුරුවම සමාජ හා පරිසර තිරසාරත්වය වෙනුවෙන් ඇප කැප වන සමාගමකි.

ලොව ප්‍රමුඛතම කෘෂිකාර්මික උපකරණ නිෂ්පාදකයෙකු වන Case IH සමාගම, මෙරට කීර්තිමත් එලායන්ස් ෆිනෑන්ස් සමාගම හා එක්වෙමින් මෙරට ගොවි මහතුන්හට කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණය සපයමින්, මෙරට කෘෂිකකර්මාන්තය තුළ තිරසාරත්වයක් හා උපරිම ඵලදායිතාවයක් ඇති කිරීම අරමුණ කොට ගෙන සිටි.

කොළඹ, අපේ ගම පරිශ්‍රයේදී මෙම සමාගම් දෙක අතර හවුල් ගිවිසුම අද අත්සන් කරනු ලැබුහ. CNH ඉන්ඩස්ට්‍රියල් සමාගමේ, ඉන්දියාව සහ SAARC රටවල කලමනාකරු වන රනුක් වර්මා මහතා, එලායන්ස් ෆිනෑන්ස් සමාගමේ කලමනාකාර අධ්‍යක්ෂ රොමානී ද සිල්වා මහතා මෙන්ම, දෙපාර්ශවයෙන්ම තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වී සිටියහ.

ගිවිසුමට අනුව, Case IH හි JXT බහු විධ ට්‍රැක්ටරය සහ Farmall JXM ට්‍රැක්ටර් පෙළ, එලායන්ස් ෆිනෑන්ස් සමාගම විසින් දිවයින පුරා බෙදැහැරීම සිදු කරනු ලබයි. මෙම අවස්ථාවට පැමිණ සිටි පුවත්පත් හා මාධ්‍ය ආයතන මෙන්ම, 25 දෙනෙකුට අධික අලෙවි නියෝජිතයින් හා පාරිභෝගිකයන්ගේ දැක ගැනීම පිණිස 2WD සහ 4WD ට්‍රැක්ටර් මාදිලිද මෙහිදී ප්‍රදර්ශනය කරන ලදී.

"ශ්‍රී ලංකාවේ Case IH නවතම නිල සහ නිත්‍ය නියෝජිත ලෙස එලායන්ස් ෆිනෑන්ස් සමාගම පත්කිරීමත් සමග මෙරට තුළ අප වෙළඳනාමය වඩාත් ශක්තිමත් අයුරින් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන බව CNH ඉන්ඩස්ට්‍රියල් සමාගමේ ඉන්දියාව සහ SAARC රටවල කලමනාකරු වන රනුක් වර්මා මහතා සඳහන් කළේය.

"ශ්‍රී ලාංකික ගොවීන්ට මෙරට කෘෂිකර්මාන්තය නඟා සිටුවීම සඳහා අවශ්‍ය යන්ත්‍රානුසාර බලය Case IH JXT ට්‍රැක්ටරය සහ Farmall JXM යන ට්‍රැක්ටර් මගින් ඉතා පහසුවෙන්ම සපයා ගත හැකි වනවා. එමෙන්ම ඉදිරියේදී Case IH හි සියලුම කෘෂිකාර්මික උපකරණ මෙරටට හඳුන්වාදීමටත් බලාපොරොත්තු වෙනවා" යනුවෙන්ද රනුක් වර්මා මහතා වැඩි දුරටත් පැවසුවේය.

එලායන්ස් ෆියිනෑන්ස් සමාගමේ කලමනාකාර අධ්‍යක්ෂ රොමානී ද සිල්වා මහතා මෙහිදී අදහස් දක්වමින් පවසා සිටියේ එලායන්ස් ෆිනෑන්ස් සමාගමේ ව්‍යාපාර නිෂ්පාදන පෙළ තවදුරටත් පුළුල් කරමින් CASE IH සමාගම සමග හවුල්කාරීත්වයක් ඇති කර ගැනීම ආඩම්බරයක් බවත් එමෙන්ම දේශගුණික තත්වයන් යටතේ ගැලපෙන කෘෂිකාර්මික නිෂ්පාදන පෙළ තුළින් තම නිෂ්පාදන මූල්‍ය මාලාව වැඩිදියුණු කර ගැනීමට හැකි වූ බවත්ය.

එලායන්ස් ෆිනෑන්ස් සමාගම සහ Case IH සමාගම අතර ඇති කරගත් හවුල්කාරීත්වයේ දිගුකාලීන වටිනාකම් පිළිබඳවත්, මෙරට ගොවි මහතුන්ට තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයකට මග පෙන්වීමට හැකිවන බවත් ඔහු වැඩි දුරටත් සඳහන් කළේය.

**ශ්‍රී ලාංකික වගාබිම් සඳහා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ**

අද දින පැවති උත්සවයේ මූලික අංගය වූයේ Case IH හි JXT බහු විධ ට්‍රැක්ටර සහ Farmall JXM ට්‍රැක්ටර් පෙළ මෙරටට හඳුන්වා දීමයි. මෙම නිෂ්පාදන පෙළෙහි 2WD සහ 4WD මාදිලි 35 - 75 HP JXT ට්‍රැක්ටර් පරාසයන්ගෙන්ද, 55 - 90 Farmall JXM ට්‍රැක්ටර් පරාසයන්ගෙන්ද, දැන් මෙරටදී මිලදී ගත හැකියි. එමෙන්ම පාරිභෝගිකයන්ට 4WD සහ ROPS මාදිලි 45 - 90 HP ට්‍රැක්ටර් පරාසයන්ගෙන්ද මිලදී ගත හැකියි.

Case IH JXT ට්‍රැක්ටර් පෙළ කුඩා පරිමාණයේ වගා බිම් සඳහා වඩාත් උචිත වුවත් එහි ශක්තිමත්භාවය හේතුවෙන් ඕනෑම වගා කටයුත්තක් සඳහා යොදා ගත හැකියි සුවිශේෂී බලගැන්වුමකින්, වේගවත් බවින්, බර ඉසිලීමේ ධාරිතාවයෙන් සහ ඇදගෙන යෑමේ ශක්තියෙන් ඔබේ අපේක්ෂාවන් ඉක්මවන අතර, ඉහළ ඉන්ධන කාර්යක්ෂමතාවයකින්ද සමන්විතයි. සරලවම මෙම ට්‍රැක්ටර් මාදිලිය විශ්වාසනීයත්වයෙන් ඉහළ වන අතර, අඩු පිරිවැය ට්‍රැක්ටරයක් ලෙස හඳුන්වා දිය හැකියි. මෙම යන්ත්‍ර මගින් ගොවි මහතුන්ට අවශ්‍ය කාර්යය ඒ අයුරින්ම සිදු කරදෙන බැවින් එය නිසි ආයෝජනයක් වන බව නොඅනුමානයි.

Case IH Farmall JXM ට්‍රැක්ටර් පෙළ පුළුල් පරාසයක සම්ප්‍රේෂණ විකල්පයන්ගෙන්ද සමන්විතයි. ඒ අනුව 12x12/8x8 සින්ක්‍රො සම්ප්‍රේෂණය සමගින් creeper options ද, 12x12/20x20 යාන්ත්‍රික සම්ප්‍රේෂණය හෝ 12x12/20x20 බල ගැන්වීමේ සම්ප්‍රේෂණ විකල්පයන් යටතේද ගොවි මහතුන්ට තෝරා ගැනීමේ හැකියාව පවතියි. මෙම ට්‍රැක්ටර් නිෂ්පාදන පෙළ ඕනෑම වගා බිමකට එක සමානවම සුදුසු වන අතර උපයෝගීතා ට්‍රැක්ටරයේ සිට මහා පරිමාණ ට්‍රැක්ටරය දක්වාම කුඩා වගා බිම් සඳහාද සරිලයි. Farmall JXM ට්‍රැක්ටරයේ දිගුකල් පවතින, ශක්තිමත් සැකිල්ල සහ උපාංග, රළු ක්‍රියාකාරීත්වය සඳහා වුවද මනාව ගැලපෙයි.

**අතීතයේ සිටම ශක්තිමත් බවින් ඉහළ Case IH**

Case IH සමාගම වසර 175 කට අධික කාලාන්තරයක් තිස්සේ එහි පාරිභෝගිකයන් සඳහා උපරිම සේවාවක් සපයමින්, නූතන කෘෂිකර්මාන්තය වෙනුවෙන්ද වඩාත් නවීකරණය කරන ලද කෘෂි උපකරණ සපයමින් සිටියි. Case IH සමාගම 19 වන සියවසේ සිට කෘෂිකාර්මික ව්‍යාපාර ක්ෂේත්‍රයේ පුරෝගාමීන් ලෙස කටයුතු කිරීම සුවිශේෂීත්වයකි. ලොව පුරා තම ජීවනෝපාය ලෙස ගොවිතැන සිදුකරන ගොවි මහතුන්හට මුහුණ දීමට සිදුවන කෘෂිකාර්මික අභියෝග වලට නිසි විසඳුම් සපයමින්, Case IH සමාගම නිරතුරුවම නූතන වගාවන්ට සරිලන නවෝත්පාදන උපකරණ හා ට්‍රැක්ටර් ඇතුළු අනෙකුත් උපාංග හඳුන්වා දෙමින් සුවිසල් මෙහෙවරක් සිදු කොට ඇත. මහා පරිමාණයේ වාණිජ්‍ය කෘෂිකර්මාන්තය සඳහා සරිලන උපරිම කාර්යක්ෂමතාවයෙන් සහ විශ්වාසනීයත්වයෙන් යුතු සුවිශේෂී උපාංග පෙළක්ද සමාගම සතු වීම විශේෂත්වයකි. එමෙන්ම Case IH සමාගම වසර 50කට අධික කාලයක් තිස්සේ උක් වගාව සඳහාද තම විශේෂඥතාවය පතුරුවමින්, උක් අස්වැන්න ලබා ගැනීමේ උපාංගද හඳුන්වා දී තිබේ.

වර්තමානය වන විට Case IH සමාගම ලොව පුරා තම වෙළඳ සන්නාමය පතුරුවමින්, පුළුල් පරාසයක් තුළ විහිදුණු කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ නිෂ්පාදකයින් ලෙස කටයුතු කරයි. ඊට අමතරව ඉතා උසස් තත්වයේ සේවාවක් තම පාරිභෝගිකයින් වෙත නිරතුරුවම සපයන Case IH සමාගම ආසියාව පුරා මෙම ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුමැති බෙදාහරින්නන් ජාලයක් සමග සම්බන්ධ වී සිටීමත්, තම නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහන් සහ යන්තෝපකරණවල ක්‍රියාකාරීත්වය පෙන්වීමත් සිදු කරයි.

පසුගිය වසර කිහිපයේ Case IH වෙළඳනාමය තවදුරටත් ඉහළ නංවමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා නව්‍යතම තාක්ෂණයෙන් යුතු ස්වයංක්‍රීය සහ ස්වතන්ත්‍ර නිෂ්පාදනද හඳුන්වා දෙනු ලැබිණි. මෙහි ක්‍රියාකාරීත්වය පෙන්වීමක් ලෙස 2016 වසරේදී නවතම ස්වයං ක්‍රියාකාරී ට්‍රැක්ටර් සංකල්පය හඳුන්වා දෙනු ලැබූ අතර, එමගින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කටයුතු කාර්යක්ෂමව, ලාභදායී සහ පරිසර හිතකාමී අයුරින් සිදු කරගැනීමට හැකියාව ලැබේ. 2018 වසරේදී Case IH සමාගම ඇමරිකාවේ ප්‍රමුඛතම ස්වයං ක්‍රියාකාරී ට්‍රැක්ටර් නිෂ්පාදකයෙකු හා ඒකාබද්ධ වෙමින් එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ ආදර්ශ වැඩසටහනක් දියත් කිරීම සිදු කළේ, එහි ක්‍රියාකාරීත්වය අවබෝධ කර ගැනීමටත් සැබෑ වශයෙන් එය කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා යෙදවිය හැකි ආකාරය පිළිබඳව අත්හදා බැලීම සඳහාත්ය. මෙම අත්හදා බැලීම තුළින් පිළිඹිබු වන්නේ Case IH සමාගම නිරතුරුවම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නවෝත්පාදන හඳුන්වා දීමට කටයුතු කරන බවත්, ඒ මගින් කෘෂිකර්මාන්තයට ඉහළ ඵලදායීතාවයක් ලබා දීමට වෙහෙසෙන බවත්ය.

[END]

ප්‍රවෘත්ති නිවේදනය සහ පින්තූර : [www.caseihmediacentre.com](http://www.caseihmediacentre.com)

*Case IH is the professionals' choice, drawing on 175 years of heritage and experience in the agricultural industry. A powerful range of tractors, combines and balers is supported by a global network of highly professional dealers dedicated to providing our customers with the superior support and performance solutions required to be productive and effective in the 21st century. More information on Case IH products and services can be found online at [www.caseih.com](http://www.caseih.com).*

*Case IH is a brand of CNH Industrial N.V., a world leader in capital goods listed on the New York Stock Exchange (NYSE: CNHI) and on the Mercato Telematico Azionario of the Borsa Italiana (MI: CNHI). More information about CNH Industrial can be found online at [www.cnhindustrial.com.](http://www.cnhindustrial.com)*

මාධ්‍ය සම්බන්ධීකරණය:

Francesca Mazza
Case IH මාධ්‍ය සම්බන්ධතා, APAC
විද්‍යුත් ලිපිනය: francesca.mazza@cnhind.com
දුරකථන: 0044 (0)7841568487